**ශ්‍රී ලංකා අග්නි දිග විශ්වවිද්‍යාලය - 2013**
**-----------------------------------------**

ශ්‍රී ලංකා අග්නි දිග විශ්වවිද්‍යාලයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්ව විද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම වාර්තාව විශ්වවිද්‍යාල පනතේ 108(2) උප වගන්තිය ප්‍රකාරව මාගේ විස්තරාත්මක වාර්තාව ලෙසද සැලකිය යුතුය.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරි වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත්වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස විශ්ව විද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්ව විද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා අග්නි දිග විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විදුලි පරිණාමකය සැපයීම හා සවිකිරීම නිමකර 2013 මැයි 07 දින විශ්ව විද්‍යාලයට භාරදී තිබුණද ඒ සඳහා ගෙවන ලද රු.11,999,504 ක මුදල මූල්‍ය ප්‍රකාශනවල වත්කම් ලෙස දක්වනු වෙනුවට කෙරීගෙන යන වැඩ ලෙස දක්වා තිබුණි.

(ආ) කුවෙට් අරමුදල යටතේ ඉදිකර 2012 වර්ෂයේදී විශ්ව විද්‍යාලයට භාරදෙන ලද රු.148,871,450 ක් වටිනාකම වූ නිල නිවාස 22 ක් ගිණුම් වලට ගෙන නොතිබුණි.

(ඇ) අභ්‍යන්තර මාර්ගය ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදී වැඩ පූර්ව අත්තිකාරම් ලෙස ගෙවන ලද රු.6,906,496 ක මුදලක් අත්තිකාරම් ලෙස වෙනම දක්වනු වෙනුවට ගොඩනැඟිලි වටිනාකමට එකතු කර තිබුණි.

**2.2.2 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

බාහිර උපාධි වැඩ සටහන සඳහා මධ්‍යස්ථානයේ කළමනාකරණ කමිටුවේ එක් එක් සාමාජිකයාට එක් රැස්වීමකට සහභාගීවීම වෙනුවෙන් රු.2,000 බැගින් එකතුව රු.72,000 ක රැස්වීම් දීමනා ගෙවීමට අමතරව, සාමාජිකයන් 10 දෙනෙකුට එකතුව රු.788,093 ක් ගරු දීමනා වශයෙන් සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණි. එහෙත් මේ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. "කළමනාකරණ මණ්ඩලයේ නිර්දේශය හා පාලන අධිකාරියේ අනුමැතිය සහිතව ගරු දීමනාව ගෙවන ලද බව උප කුලපති විසින් මා වෙත දන්වා තිබුණි. "

**2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් අවස්ථා පහත විග්‍රහකර දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 109 වගන්තිය | 2012 වර්ෂය සඳහා විගණිත මූල්‍ය ප්‍රකාශන හා විගණකාධිපතිවරයාගේ වාර්තාව රජයේ ගැසට් පත්‍රයේ මේ දක්වා ප්‍රසිද්ධ කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | මුදල් රෙගුලාසි (මු.රෙ.) | |
| | (i) මුදල් රෙගුලාසි 138 | සමාලෝචිත වර්ෂය තුළදී සිදුකරන ලද එකතුව රු.253,000 ක් වූ ගෙවීම් දෙකක් සහතික කිරීම සඳහා වගකීම් දරන නිලධාරියා විසින් සහතික කර නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 702(3) | රු.105,706,404 ක් වටිනාකම වූ කොන්ත්‍රාත් ගිවිසුම් 22 ක පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ X පරිච්ඡේදයේ 20.6 වගන්තිය | සමාලෝචිත වර්ෂය තුළදී අනධ්‍යයන හා පරිපාලන කාර්ය මණ්ඩලයේ 13 දෙනෙකු විසින් දින 223 ක වැටුප් රහිත නිවාඩු ලබා ගෙන තිබුණි. කෙසේ වුවද එම වැටුප් රහිත නිවාඩු පිළිබඳ විස්තර විශ්ව විද්‍යාලය විසින් පොදු ආකෘති 96 මඟින් විගණකාධිපතිවරයාට වාර්තා කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂය තුළ විශ්ව විද්‍යාලයේ වැඩ කටයුතුවලින් වූ ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන ගණන් ගැනීමට පෙර රු.577,710,687 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.442,113,071 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.135,597,616 ක පිරිහීමක් දැක්වුණි. මෙම පිරිහීම සඳහා වෙනත් ආදායම රු.3,009,901 කින් අඩුවීම හා වියදම රු.132,587,716 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂය තුළ විශ්ව විද්‍යාලයේ අධ්‍යයන කාර්ය සාධනය පහත පරිදි වේ.

**(අ) උපාධි පාඨමාලා**

පසුගිය වර්ෂ 02 තුළ එක් එක් පීඨය සඳහා බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව හා උපාධිය ලබාගැනීමෙන් පසු ඉවත්වූ ශිෂ්‍ය සංඛ්‍යාව පහත දැක්වේ.

| පවත්වන ලද උපාධි පාඨමාලා | ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව | | උපාධි ලබාගත් ශිෂ්‍ය සංඛ්‍යාව | |
|---|---|---|---|---|
| | 2013 | 2012 | 2013 | 2012 |
| ව්‍යවහාර විද්‍යාව | 243 | 273 | 33 | 43 |
| කලා හා සංස්කෘති | 418 | 128 | 134 | 179 |
| කළමනාකරණ හා වාණිජ | 376 | 354 | 167 | 106 |
| ඉස්ලාම් හා ආරබි භාෂා | 231 | 261 | 107 | 88 |
| ඉංජිනේරු | 102 | - | - | - |
| එකතුව | 1,370 | 1,016 | 441 | 416 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයේදී කලා හා සංස්කෘතිය පීඨය සහ කළමනාකරණ හා වාණිජ පීඨය සඳහා සිසුන් බඳවා ගැනීම පිළිවෙලින් සියයට 226 කින් හා සියයට 6 කින් වැඩිවී තිබුණු නමුත් සමාලෝචිත වර්ෂයේදී ව්‍යාවහාර විද්‍යා පීඨය සහ ඉස්ලාම් හා අරාබි භාෂා පීඨය සඳහා සිසුන් බඳවා ගැනීම පිළිවෙලින් සියයට 11.0 කින් හා සියයට 11.5 කින් අඩුවී තිබුණු බව නිරීක්ෂණය විය.

(ii) ලබාගත හැකි වූ තොරතුරු අනුව, විශ්ව විද්‍යාලය කලා හා සංස්කෘතිය පීඨය සඳහා සිසුන් 250 ක් ඇතුළත් කර ගැනීමට යෝජිතව තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය තුළ සිසුන් 418 ක් එම පීඨයට බඳවා ගෙන තිබූ බැවින් යෝජිත සීමාවට වඩා සිසුන් 168 ක් බඳවා ගෙන තිබුණි.

**(ආ) ඒක ශිෂ්‍ය පිරිවැය**

සමාලෝචිත වර්ෂය සඳහා විශ්ව විද්‍යාලයේ එක් එක් පීඨයේ මුළු පිරිවැය සහ ඒක ශිෂ්‍ය පිරිවැය පහත දැක්වේ.

| | ව්‍යවහාර විද්‍යා පීඨය | කලා හා සංස්කෘතිය පීඨය | ඉස්ලාම් හා අරාබි භාෂා පීඨය | කළමනාකරණ හා වාණිජ පීඨය | ඉංජිනේරු පීඨය | එකතුව |
|---|---|---|---|---|---|---|
| මුළු පිරිවැය (රු.000) | 72,657 | 66,490 | 29,600 | 52,861 | 15,099 | 236,707 |
| මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | 481 | 748 | 602 | 915 | 99 | 2,845 |
| ඒක ශිෂ්‍ය පිරිවැය (රු.000) | 151 | 90 | 49 | 58 | 152 | 83 |

රු.152,000 ක්වූ ඉහළම ඒක ශිෂ්‍ය පිරිවැය ඉංජිනේරු පීඨයෙන් වාර්තා වූ අතර රු.49,000 ක් වූ අඩුම ඒක ශිෂ්‍ය පිරිවැය ඉස්ලාම් හා අරාබි භාෂා පීඨයෙන් වාර්තා විය.

**4.2 විභාග ප්‍රතිඵල**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1995 ජුලි 14 දිනැති අංක 636 දරන විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයට අනුව, විභාග දිනයෙන් පසු මාස තුනක් ඇතුළත විභාග ප්‍රතිඵල නිකුත් කළ යුතුය. කෙසේ වුවද විභාග ප්‍රතිඵල මාස 02 කින් ප්‍රමාද කර තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) 2011/ 2012 අධ්‍යයන වර්ෂය තුළ ව්‍යාපාර පරිපාලන ශාස්ත්‍රපති උපාධිය (MBA) සඳහා ලියාපදිංචි වූ ශිෂ්‍යයන් 41 ක් අතුරින් ගෙන් මේ දක්වා උපාධි ලබාගෙන ඇත්තේ ශිෂ්‍යයන් 9 ක් පමණක් විය.

**4.3 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බැඳුම්කරයේ වලංගු කාලය 2010 ජනවාරි 10 දිනට ඉකුත් වී තිබුණද ගිවිසුම් කඩ කිරීම වෙනුවෙන් රු.8,942,758 ක මුදලක් කථිකාචාර්යවරයකුගෙන් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා විශ්ව විද්‍යාලය කටයුතු කර නොතිබුණි.

(ආ) 2010 ජනවාරි 22 දින සිට සේවය අත්හැර ගිය ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකුට අදාළව රු.1,581,737 ක මුදලක් හිඟ හිට පැවතුණි. කෙසේ වුවද මෙම හිඟ ශේෂය ඔහුගේ විශ්ව විද්‍යාල අර්ථ සාධක අරමුදලින් අයකර ගැනීමට හෝ ඔහුට විරුද්ධව නීතිමය කටයුතු සිදුකිරීමට විශ්ව විද්‍යාලය විසින් විධිමත් පියවර ගෙන නොතිබුණි.

**4.4 භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය**

---------------------------------

**අල්මාරි සහිත ඇඳන් මිලදී ගැනීම**

-----------------------------------

අල්මාරි සහිතව ඇඳන් 245 ක් මිලදී ගැනීම සඳහා විශ්ව විද්‍යාලය විසින් පුද්ගලික සැපයුම්කරුවකුට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබූ අතර 2013 නොවැම්බර් 21 දක්වා රු.3,185,000 ක මුදලක් සැපයුම්කරුට ගෙවා තිබුණි.
මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සැපයුම්කරු සඳහා කරන ලද ඇණවුම් ලියවිල්ලට අනුව, අල්මාරි සහිත ඇඳන් 145 ක් 2013 ජූලි 01 දිනට හෝ ඊට පෙර සැපයුම් කළ යුතු විය. කෙසේ වුවද සැපයුම්කරු විසින් මෙම අල්මාරි සහිත ඇඳන් සපයා තිබුණේ මාස 2 සිට මාස 5 ක් දක්වා කාල ප්‍රමාදයකින් පසුවය. සැපයුම්කරු විසින් මෙම ඇඳන් සැලකිය යුතු කාල ප්‍රමාදයක් සහිතව සපයා තිබුණද, ප්‍රමාද ගාස්තු අයකර ගැනීම සම්බන්ධයෙන් ඇණවුම් ලියවිල්ලේ විධිවිධාන ඇතුළත් නොකිරීම හේතුවෙන් සැපයුම්කරුගෙන් ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට විශ්ව විද්‍යාලයට නොහැකි වී තිබුණි.

(ආ) 2013 මාර්තු 27 දින පත්වන ලද සැපයුම් කමිටු රැස්වීමට අනුව, 6'.0" x 2'.5" ප්‍රමාණයේ ඇඳන් මිලදී ගැනීමට කමිටුව අනුමත කරන ලදි. කෙසේ වුවද ඉහත සඳහන් කමිටු රැස්වීමේ තීරණය සැලකීමෙන් තොරව 7'.6" x 2'.6" ප්‍රමාණයේ අල්මාරි සහිත ඇඳන් මිලදී ගැනීමට මිල ගණන් කැඳවා තිබුණි.

(ඇ) පිරිවිතරට අනුව ඇඳෙහි මැදට දිග 2' - 2"(2" x 2") ප්‍රමාණයේ තේක්ක ලී සවිකළ යුතුය. කෙසේ වුවද 2014 පෙබරවාරි 13 සිදුකරන ලද භෞතික පරීක්ෂණයට අනුව, එවැනි තේක්ක ලී සවිකිරීමෙන් තොරව සැපයුම්කරු විසින් ඇඳන් සපයා ඇති බව නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස දළ වශයෙන් රු.98,000 ක මුදලක් සැපයුම්කරුට වැඩිපුර ගෙවා තිබුණි.

(ඈ) සැපයුම්කරු විසින් සපයන ලද අල්මාරි සහ ඇඳන්වල බොහෝ අඩුපාඩු තිබුණද, පිරිවිතරවලට අනුව හා හොඳ තත්ත්වයෙන් භාණ්ඩ සපයා තිබුණු බවට වැඩ ඉංජිනේරු විසින් බිල්පත්‍ර සහතික කර තිබුණි. එම ඇඳන් සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ අඩුපාඩු පහත දැක්වේ.

- ★ අල්මාරියේ මැද ලීය සඳහා තේක්ක දැව යොදා ගනු වෙනුවට සපු දැව යොදා ගෙන තිබුණි.
- ★ අල්මාරියේ නිමාව සුමට නොවීය.
- ★ සමහර අල්මාරි සඳහා හැඬලය හා ලොක් සවිකර නොතිබුණි.

**4.5 කොන්ත්‍රාත් පරිපාලනය**

**(අ) ක්‍රීඩා භූමිය ඉදිකිරීම**

ක්‍රීඩා භූමිය සඳහා බොරළු සැපයීම හා ඇතිරීම වෙනුවෙන් කොන්ත්‍රාත්තුවක් විශ්ව විද්‍යාලය විසින් පුද්ගලික සමාගමකට ප්‍රදානය කර තිබුණු අතර 2013 සැප්තැම්බර් 16 දක්වා රු.749,100 ක මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) සැපයුම්කරුවන් දෙදෙනෙකු විසින් දී තිබුණු ලිපිනයන්හි කිසිදු ව්‍යාපාර ආයතනයක් නොවීය. ඒ අනුව, මෙම කොන්ත්‍රාත්තුවෙන් උපරිම ප්‍රතිලාභ ලබාගැනීමේ අරමුණින් එකම සැපයුම්කරු විසින් මිල සැඳහුම් තුනම විවිධ නම්වලින් ඉදිරිපත් කර තිබූ බව ප්‍රත්‍යක්ෂ විය.

(ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව, උප කුලපති විසින් වැඩ ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාදීමේ බලතල සීමාව රු.250,000 ට අඩුවේ. එබැවින් බොරළු ලොරි පැටවුම් 43 ක් සැපයීම හා ඇතිරීම සඳහා රු.249,572 ක ඇස්තමේන්තුවක් විශ්ව විද්‍යාලය විසින් පිළියෙල කර තිබුණි. කෙසේ වුවද ඉහත සඳහන් කාර්යය නිම කිරීම සඳහා විශ්ව විද්‍යාලය විසින් රු.749,100 ක් ගෙවා බොරළු ලොරි පැටවුම් 129 ක් මිලදී ගෙන තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබා නොගැනීමේ අරමුණින් වැඩ පිළිබඳ අඩු තක්සේරුවක් දක්වා ඇස්තමේන්තු පිළියෙල කර තිබූ බව ප්‍රත්‍යක්ෂ වේ.

(iii) විශ්ව විද්‍යාලයේ ශාරීරික අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් කරන ලද ඉල්ලීමට අනුව, බොරළු සැපයීම හා ඇතිරීමේ කාර්යය ඉතා අත්‍යවශ්‍ය කාරණයක් ලෙස සලකමින් 2013 සැප්තැම්බර් 16 දිනට නිම කළ යුතු විය. ඉහත කාර්යය 2013 සැප්තැම්බර් 16 දින නිම කර තිබුණද, අත්පන්දු ක්‍රීඩාංගනය, පැසිපන්දු ක්‍රීඩාංගනය හා ටෙනිස් ක්‍රීඩාංගනය මේ වන විටත් තෝරාගත් ස්ථානයේ සකස් කර නොතිබුණි. එබැවින් ඉහත කාර්යය සඳහා වැය කරන ලද මුදල නිෂ්ඵල වියදමක් බවට පත්වී තිබුණි.

**(ආ) ප්‍රවේශ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම**

2013 මාර්තු 20 දිනැති අංක එස්ඊයුඑස්එල්/සීඩබ්ලිව් සහ පී / 195 (1) දරන කොන්ත්‍රාත් ගිවිසුම අනුව, කිමී 1.2 ක් දිග ප්‍රවේශ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේ කොන්ත්‍රාත්තුව ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයට ප්‍රදානය කර තිබූ අතර 2013 අගෝස්තු 23 දක්වා රු.23,088,431 ක මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) විශ්ව විද්‍යාලයේ උප කුලපති සහ කොන්ත්‍රාත්කරු අතර 2013 මාර්තු 20 දින කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබුණද, ගිවිසුමේ දිනයට මාස 2 කට පෙර ඉදිකිරීම් වැඩ ආරම්භ කර තිබුණි.

(ii) කොන්ත්‍රාත් ගිවිසුමට අනුව කොන්ත්‍රාත් වැඩ 2013 අප්‍රේල් 09 දිනට පෙර නිම කළ යුතු විය. කෙසේ වුවද එය 2013 මැයි 09 දින නිම කර තිබුණි. එබැවින් කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව අයකළ යුතු ප්‍රමාද ගාස්තු රු.403,650 ක මුදලක් කොන්ත්‍රාත්කරුගෙන් අයකර නොතිබුණි.

**4.6 කාර්ය මණ්ඩලයට විශ්ව විද්‍යාල නිල නිවාස ලබාදීම**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) විශ්ව විද්‍යාලයේ මාර්ගෝපදේශ හා රෙගුලාසිවල 6.6 වගන්තිය අනුව විශ්ව විද්‍යාල නිල නිවාස ලබාගන්නා නිලධාරින් විශ්ව විද්‍යාලය සමඟ ගිවිසුමකට එළඹිය යුතුය. කෙසේ වුවද විවාහක නිල නිවාස 12 ක සහ අවිවාහක නිල නිවාස 8 ක පදිංචි වී සිටි අධ්‍යයන කාර්ය මණ්ඩලය විශ්ව විද්‍යාලය සමඟ ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 05 වගන්තිය අනුව, නිල නිවාසවල පදිංචි වී සිටීම වෙනුවෙන් පදිංචිකරුවන්ගේ වැටුපෙන් කුලී අයකර ගත යුතුය. කෙසේ වුවද විශ්ව විද්‍යාල නිල නිවාසවල පදිංචිව සිටින අධ්‍යයන කාර්ය මණ්ඩලයෙන් මේ දක්වා කුලී අයකර නොතිබුණි.

(ඇ) ඉහත සඳහන් විශ්ව විද්‍යාල නිවාස සඳහා 2010 ජනවාරි සිට 2013 නොවැම්බර් කාල පරිච්ඡේදය වෙනුවෙන් විදුලි ගාස්තු රු.902,741 ක මුදලක් විශ්ව විද්‍යාලය විසින් ගෙවා තිබුණි. කෙසේ වුවද ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 5.8 වගන්තිය ප්‍රකාරව පදිංචිකරුවන්ගෙන් විදුලි ගාස්තු අයකර ගැනීම සඳහා, විගණන දිනය වූ 2014 අප්‍රේල් 11 දින දක්වා කිසිදු විධිමත් පියවරක් ගෙන නොතිබුණි.

(ඈ) විශ්ව විද්‍යාල මාර්ගෝපදේශ හා රෙගුලාසිවල 8.3 වගන්තිය ප්‍රකාරව විශ්ව විද්‍යාල ලේඛකාධිකාරිවරයාගෙන් පූර්ව අනුමැතිය ලබා ගැනීමෙන් තොරව විශ්ව විද්‍යාල නිල නිවාසයක පදිංචිව සිටි ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු විසින් ස්වකීය මුදල්වලින් වායු සමීකරණ යන්ත්‍රයක් නිල නිවාසයට සවිකර ගෙන තිබුණි.

**4.7 පුස්තකාල පරිපාලනය**

අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් ලබාගන්නා ලද පුස්තකාල පොත් වර්ෂ 01 සිට වර්ෂ 04 දක්වා දිගු කාල ප්‍රමාදයකින් පසුව ආපසු භාරදී ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය. කෙසේ වුවද, 2014 ජුලි 27 දිනැති සනාථන සහා රැස්වීම් සටහන් ප්‍රකාරව, දඩ මුදල් ගණනය කිරීමට හා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.8 මානව සම්පත් කළමනාකරණය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පුරප්පාඩු 88 ක් පිරවීම සඳහා විශ්ව විද්‍යාලය විසින් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) පීඨ 05 ක මහාචාර්යවරු , සහාය මහාචාර්යවරු වැනි ප්‍රධාන තනතුරුවල පුරප්පාඩු 08 ක් පැවතුණි. කෙසේ වුවද ශිෂ්‍යයන්ගේ අධ්‍යයන කටයුතු වලට බලපෑම් සිදුවිය හැකි ඉහත පුරප්පාඩු පිරවීම සඳහා විශ්ව විද්‍යාලය විසින් පියවර ගෙන නොතිබුණි.

## 5. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

### 5.1 වාර්ෂික වාර්තාව සභාගත කිරීම

2012 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව 2014 ජුනි 03 දක්වා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 5.2 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත වියදම හා තථ්‍ය වියදම අතර සියයට 52 සිට සියයට 58 දක්වා විචලනයන් නිරීක්ෂණය වුයෙන්, අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබු බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(අ) ගිණුම්කරණය
(ආ) ණය හා අත්තිකාරම් අයකර ගැනීම
(ඇ) ස්ථාවර වත්කම් පිළිබඳ පාලනය
(ඈ) ලේඛන පවත්වා ගැනීම